# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
# பொலிஸ் ஊடகப் பிரிவு
# POLICE MEDIA DIVISION

14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| දිනය Date | 2025.04.19 පැය 2140 | දුරකථන අංකය Tel.NO | 011-2887973 | මගේ අංකය My NO | D/Media/Out/780 /2025 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |

**ප්‍රධාන කර්තෘ / ප්‍රවෘත්ති කර්තෘ,**
**අධ්‍යක්ෂ ප්‍රවෘත්ති / ප්‍රවෘත්ති කළමණාකරු,**
**සියළුම මාධ්‍ය ආයතන.**

**"සිරි දළදා වන්දනාව" වෙනුවෙන් බැතිමතුන්ගේ පැමිණීමේ වර්ධනයක්, හෙට දින විශාල බැතිමතුන් ප්‍රමාණයක් පැමිණෙතැයි අපේක්ෂා කෙරේ - පොලිස් මූලස්ථානය.**

"සිරි දළදා වන්දනාව" 2025.04.18 වන දින ආරම්භ කල අතර 2025.04.19 වන අද දින තුල එක්ලක්ෂ විසි දහසකට අධික බැතිමතුන් ප්‍රමාණයක් වන්දනාමාන කරගෙන ඇත. 2025.04.20 වන හෙට දිනද "සිරි දළදා වන්දනාව" සිදු කර ගැනීම සඳහා අද දින රාත්‍රී 0900 පමණ වන විට පනස්දහසකට අධික සැදැහැවතුන් පිරිසක් මහනුවර නගරය වෙත එක් රැස්ව සිටින අතර හෙට දින උදෑසන වන විට එම ප්‍රමාණය ලක්ෂය ඉක්මවා පැමිණෙනු ඇතැයි අපේක්ෂා කරයි.

එමෙන්ම 2025.04.20 වන හෙට දින සතිඅන්ත දිනයක් බැවින් දහවල් කාලය වන විට මෙම ප්‍රමාණය තව දුරටත් ඉහල යා හැක. හෙට දින හැර තවත් දින 07ක කාලයක් "සිරි දළදා වන්දනාව" සිදු කර ගැනීමට හැකියාව ඇති හෙයින් හෙට දිනය මගහැර ඉදිරි දිනයක් යොදා ගැනීමට කටයුතු කිරීම මගින් බැතිමතුන්ට පහසුවෙන් වන්දනාමාන කර ගැනීමට හැකියාව පවතින බව පොලිසිය මහජනතාව වෙත දන්වා සිටී.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය**